කවරයේ කතාව

# අපේ අභිමානය ලොවට පෙන්වන ලංකා තේ කෞතුකාගාරය

තේ කෞතුකාගාරයේ සභාපති
**අජිත් ගුණතිලක විසිනි**

**මහනුවර හන්තානේ ලංකා තේ කෞතුකාගාරය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ලංකා වැවිලිකරුවන් ගේ සංගමය, කොළඹ තේ වෙළෙඳුන් ගේ සංගමය ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පූර්ණ සහයෝගය ඇතිව ඉදිකරන ලද ලෝකයේ දැනට ඇති එම වර්ගයේ එකම අද්විතීය කෞතුකාගාර ව්‍යාපෘතියයි.**



එහි ඇති දුර්ලභ කෞතුක භාණ්ඩ, අප රටේ තේ කර්මාන්තයේ ඉතිහාසය එනම් ලංකාවේ තේ කර්මාන්තයේ පියා ලෙසින් හඳුන්වන ස්කොට්ලන්ත ජාතික ජේම්ස් ටේලර් මහතා විසින් ක්‍රි. ව. 1867 දී මහනුවර දිස්ත්‍රික්කයේ හේවාහැට ලූල්කඳුර වත්තේ ප්‍රථමයෙන් ආරම්භ කරන ලද තේ කර්මාන්තයේ වීර කථාන්තරය විදහා දක්වයි.

ජේම්ස් ටේලර් මහතා විසින් පුරා අවුරුදු 5 ක් තිස්සේ ලූල්කඳුර වත්තේ අක්කර 10 ක බිම් ප්‍රමාණයක පර්යේෂණාත්මකව කරන ලද තේ වගාවෙන් ප්‍රථම වරට තේ රාත්තල් 23 ක් එංගලන්තයට නැව්ගත කර රු. 58/- ක වටිනාකමක් ලබා ගන්නා ලදී.


තේ කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීමට මූලික වූ ජේම්ස් ටේලර් 1835 වසරේ දී ස්කොට්ලන්තයේ ඇබර්ඩීන් හි මොන්බෝඩියා වත්තේ මොස්පාර්ක් නිවසෙහි මයිකල් හා මාග්‍රට්ට දාව උපත ලැබීය. (ජේම්ස් ටේලර් මහතාගේ උඩුකය ප්‍රතිමාවක් තේ කෞතුකාගාරයට ඇතුළුවන දොරටුවෙහි තබා ඇත)



කෞතුකාගාරයේ කළමනාකරු
ධර්මසිරි මඩුගල්ල

1892 දී ජේම්ස් ටේලර් මහතා සිය වත්තේදීම (ලූල්කඳුර) මිය ගියේ ය. ඒ ඔහුට වයස අවුරුදු 57 ක් සම්පූර්ණවීමෙනි. ඔහු ගේ මෘත දේහය සමාදානයේ සැතපීමට ලූල්කඳුර වත්තේ සිය කම්කරුවන් ගේ කරමතින් මහනුවර මහයියාවේ සුසාන භූමියට ගිය අතර එහි භූමදානය කරන ලදී. ඔහු ගේ සොහොන් කොතේ ඡායාරූපයක් කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත.

ලංකාවේ තේ කෞතුකාගාරයක් පිහිටුවීම පිළිබඳ සංකල්පය බොහෝ කාලයක සිට පැවතියත් එය යථාර්ථයක් බවට පත් වූයේ කලිෆඩ් රත්වත්තේ මහතා 1994-10-12 වැනි දින සිට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති වශයෙන් පත්වීමෙන් පසුවය. ඒ මහතා මෙය යථාර්ථයක් බවට පත් කිරීමට මූලික පියවරයන් කීපයක් ගත්තේ ය. රත්වත්තේ මහතා හා මා මේ සම්බන්ධව නිතර නිතර මුහුණගැසී සාකච්ඡා කරන ලද අතර කෞතුකාගාරය පිහිටුවීම සඳහා සුදුසු ස්ථානයක් තේ වගාකරන ප්‍රදේශවලින් සෙවීමෙහි නිරත වූයෙමු. නිරීක්ෂණ චාරිකා කීපයකින් පසුව දිනක් මහනුවර හන්තාන තේ පර්යේෂණායතන සංචාරක බංගලාවේ අප දෙදෙනා සිටින විට මා නෙත අහම්බෙන් ගැටුනේ අත්හැරදමා සම්පූර්ණයෙන්ම ගරා වැටෙමින් තිබුණු හන්තාන තේ කර්මාන්තශාලාවයි. නවදුරටත් කාලය ගත නොකළ අප දෙදෙනා හන්තාන තේ කම්හල සමීපයට ගියෙමු. මනස්කාන්ත පරිසරයක පිහිටා තිබූ හන්තාන තේ කර්මාන්තශාලාවේ උඩුමහලට පිවිසි අප අවට්න් ඇති තේ වතුවල සුන්දර දර්ශනයන් ද ඈතින් ඇති නුවරන්සගිරිය කඳුවැටිය සහ මීදුමින් වැසුනු නකල්ස් කඳු සමූහයත් ය. තේ කෞතුකාගාරය පිහිටුවීමට සුදුසුම ස්ථානය මෙය බවට අප දෙදෙනා




එවෙලේම තීන්දු කළෙමු. ඒ අනුව තේ කෞතුකාගාරය 1998 ජනවාරි මාසයේ දී සමාගම් පනත යටතේ "සිලෝන් ටී මියුසියම් කම්පැනි" නමින් සංස්ථාගත විය. ක්‍රි. ව. 1925 දී "ගෝර්ඩන් පයිපර්" විසින් ගොඩනගන ලද 1986 සිට තේ නිෂ්පාදනය නොකර අත්හැරදමා තිබුණු හන්තාන තේ කම්හල එතැන් පටන් ලංකා තේ කෞතුකාගාරයේ නිවහන බවට පත්විය.

මේ අතර තේ කෞතුකාගාර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කෞතුකාගාරයේ කළමනාකරු වශයෙන් තේ නිෂ්පාදනය පිළිබඳ අත්දැකීම් බහුල, වතු පාලනය පිළිබඳ මනා දැනුමක් ඇති, මෑතක දී වැවිලි කර්මාන්තයෙන් විශ්‍රාම ලත් ධර්මසිරි මඩුගල්ලේ මහතා පත් කර ගන්නා ලදී. ඔහු තම පත්වීමේ සිටම වෙහෙස නොබලා, දිවයිනේ සියලුම තේ වතුවලට හා කර්මාන්තශාලාවලට ගොස්, ප්‍රදර්ශනයට සුදුසු පැරණි යන්ත්‍රෝපකරණ හා අයිතමයන් සෙවීමෙහි නිරත විය. ඔහු ගේ සොයා ගැනීම්වල ප්‍රතිඵලයකි රංගල ගිරිත්දිඇල තේ කර්මාන්තශාලා භූමියෙහි අඩි 10 ක් පමණ පසින් යට වී තිබූ අවුරුදු 100 ක් බලයක් ඇති යන්ත්‍රය (Water driven peltan) විදුලි බලය ඒමට ප්‍රථම ලංකාවේ තේ කර්මාන්තශාලා සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූයේ මෙවැනි යන්ත්‍ර බලයෙනි.

මේ ආකාරයට පැරණි යන්ත්‍රෝපකරණ සහ තේ කර්මාන්තයට අදාළ අතිකුත් අයිතමයන් සොයා තේ කෞතුකාගාරය වෙත ගෙනැවිත් නැවත යථා තත්ත්වයට පමුණුවා ප්‍රදර්ශනයට සූදානම් කරන ලදී.

1999 මැද භාගයේ දී ආරම්භ කරන ලද මෙම මෙහෙයුම අධිෂ්ඨානයෙන් හා ක්‍රියාශීලීව තේ කෞතුකාගාරය විධිමත්ව විවෘතකරන තෙක් කරගෙන යන ලදී. කෞතුකාගාර ගොඩනැගිල්ල පිළිසකර කිරීම හා යළි සකස් කිරීමේ කටයුතු ප්‍රධාන පෙළේ ගෘහ නිර්මාණශිල්පියකු වූ සුනිල් ආමෙන්ද්‍රා මහතා

*1999 මැද භාගයේ දී ආරම්භ කරන ලද මෙම මෙහෙයුම අධිෂ්ඨානයෙන් හා ක්‍රියාශීලීව තේ කෞතුකාගාරය විධිමත්ව විවෘතකරන තෙක් කරගෙන යන ලදී. කෞතුකාගාර ගොඩනැගිල්ල පිළිසකර කිරීම හා යළි සකස් කිරීමේ කටයුතු ප්‍රධාන පෙළේ ගෘහ නිර්මාණශිල්පියකු වූ සුනිල් ආමෙන්ද්‍රා මහතා ගේ හා කොළඹ කොමර්ෂල් ඉංජිනේරු සමාගමේ මහනුවර ශාඛාවේ ඉංජිනේරු චන්ද්‍රා දිසානායක මහතා ගේ මඟ පෙන්වීම යටතේ 2000 ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කරන ලදී.*

ගේ හා කොළඹ කොමර්ෂල් ඉංජිනේරු සමාගමේ මහනුවර ශාඛාවේ ඉංජිනේරු චන්ද්‍රා දිසානායක මහතා ගේ මඟ පෙන්වීම යටතේ 2000 ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කරන ලදී.

අවුරුද්දක අඛණ්ඩ මෙහෙයුමකින් පසු නටබුන්ව ගරා වැටෙමින් තිබූ හන්තාන තේ කර්මාන්තශාලාව පැරණි තත්ත්වය විදහාපාන පරිදි සම්පූර්ණයෙන්ම යළි ප්‍රතිසංස්කරණය කරන ලදී.

තේ කෞතුකාගාරය 2001 නොවැම්බර් මස 29 වැනි දින එවකට ගරු වැවිලිකර්මාන්ත අමාත්‍යවරයාව සිටි රත්නසිරි වික්‍රමනායක මැතිතුමා විසින් මහජනතාව සඳහා විධිමත්ව විවෘත කරන ලදී.

මහල් 5 කින් සමන්විත තේ කෞතුකාගාරයේ බිම් මහලෙහි තේ නිෂ්පාදනය සඳහා ප්‍රයෝජනයට ගත් ඉතා දුර්ලභ ගණයේ යන්ත්‍රෝපකරණ ප්‍රදර්ශනයට තබා ඇති අතර සමහර අයිතමයන් දැනට ලෝකයේ තිබෙන එකම නිදසුනකි. පළමු මහලේ ජේම්ස් ටේලර් ලේඛනාගාරය හා පුස්තකාලය වන අතර එහි තේ කර්මාන්තය හා සම්බන්ධ පැරණි ලේඛන පොත්පත් හා ඡායාරූප ප්‍රදර්ශනය කෙරේ. අංග සම්පූර්ණ ශ්‍රවනාගාරයක්ද එහි වේ. පළමු මහලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රදර්ශන කුටියෙන් තේ පර්යේෂණායතනයේ ආරම්භය විකාශය හා එහි ක්‍රියාකාරකම් පිළිබිඹු වේ. දෙවැනි මහලේ සම්ප්‍රදායික තේ මැලවීමේ ක්‍රියාදාමය නිරූපනය කෙරෙන අතර 1854 සිට වැවිලිකරුවන් ගේ සංගමයේ හිටපු සභාපතිවරුන් ගේ හා ලේකම්වරුන් ගේ නාම ලේඛනයන් සහිත පුවරු ප්‍රදර්ශනයට තබා ඇත. තෙවැනි මහලේ තේ වෙළෙඳසැල් සහ අත්කම්භාණ්ඩ වෙළෙඳසැල්වලින් ලංකාවේ හොඳම තේ වර්ග සහ තේ හා සම්බන්ධ තෑගි භාණ්ඩ මිලදී ගත හැකිය. සිව්වැනි මහලේ තේ අවන්හලක් ද අවට පරිසරය නැරඹීම සඳහා දුර දක්නයක් ද සවිකර ඇත.

මෙම අද්විතීය තේ කෞතුකාගාරයේ මූලික අරමුණු වන්නේ.

1. තේ කර්මාන්තයට අදාළ යන්ත්‍රෝපකරණ, ලියකියවිලි, පොත්පත්, ඡායාරූප ඇතුළු ඓතිහාසික අගයකින් යුත් වෙනත් ද සිහිවටනයන් ලෙස ආරක්ෂා කිරීම හා ප්‍රදර්ශනය කිරීම

2. ලොව පතල පානයක් ලෙස තේ ප්‍රවර්ධනය කර ඒ මඟින් ශ්‍රී ලංකාවේ තේ අපනයනය ඉහළ නැංවීම

3. තේ කර්මාන්තයේ උන්නතියට උපකාරීවන තොරතුරු ප්‍රසිද්ධකර බෙදා හැරීම


4. ලෝක තේ අපනයනයේ ප්‍රමුඛයා ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අඛණ්ඩව ශක්තිමත් කරමින් තේ කර්මාන්තය හරහා සංචාරක කර්මාන්තය ප්‍රචලිත කිරීම

5. ශ්‍රී ලංකාවේ තරුණ හා ළමා පරපුරට තේ කර්මාන්තයේ ඉතිහාසය හා ලංකාවේ ආර්ථිකයට එහි දායකත්වය පිළිබඳ දැනුවත් කිරීම


ඉහත අරමුණු ඉටුකර ගැනීම ලංකාවේ තේ කර්මාන්තයට ලැබෙන ප්‍රතිලාභයක් වන අතර ලංකා තේ කෞතුකාගරය ද එහි කොටස් කාරයෙකි.

❑

**පරිවර්තනය -**
**ශ්‍රී ලංකා තේ කෞතුකාගාරයේ ගණකාධිකාරී**
**ඇස්.ඒ. ධර්මවර්ධන.**




1880 දී නිෂ්පාදිත අශ්වබල
8 ක "හොම් බල්බ" එන්ජිම





1880 දී
එංගලන්තයේ දී
නිෂ්පාදිත අශශ්ව
බල 42 තටුරොල්
එන්ජිම





ලංකාවේ
පළමු වැනි
තේ අඹරනය.
මෙය අතින්
කරකවන ලදී.




ද්විත්ව ක්‍රියාකාරී
තේ අඹරනය - 1820




තේ අඹරනය - 1890




තේ පෙරණය.
මෙය විනාඩි 10 ක්
පමණ ක්‍රියාත්මක
කළ යුතුය



අතීතයේදී දර දමා
රත්කරන ලද උඳුන.
මෙයින් තේදලු වියළා
ගැනීමට උෂ්ණත්වය
උපයෝගී
කොට ගෙන ඇත.



1921 දී නිෂ්පාදිත
අශ්ව බල 40 ක තල බඹරය